ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2496/12 - 2026 ජූලි මස 07 වැනි අඟහරුවාදා - 2026.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 39 වන වගන්තිය යටතේ ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් සාදන ලද රීති.

ඉංජි. (ආචාර්ය) **තිලක් ද සිල්වා,**
සභාපති.

2026 ජුනි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව,
කොළඹ දී ය.

රීතිය

රීති අංක: 1/2026

01. මෙම රීතිය ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මිකයකු ලෙස ලියාපදිංචි කිරීමේ රීතිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

    ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම.

02. 2028 ජනවාරි 01 දින සිට 2029 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස එයට අදාළ කටයුතුවල නියැලීමට ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 3 වන මට්ටම (NVQ Level 3) අවම සුදුසුකම ලෙස තිබීම අනිවාර්ය වේ.

03. 2030 ජනවාරි 01 දිනෙන් පසුව, ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පියෙකු සහ ජංගම වායුසමන කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීමට අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

- ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 4 මට්ටම. (NVQ Level 4)
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචිවීම.

04. අදාළ ජාතික වෘත්තීය නිපුණතා විෂය ක්ෂේත්‍ර ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

05. මෙම නියාමන පියවර ක්‍රියාත්මක කරනුයේ ශ්‍රී ලංකාවේ ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පීන්ගේ සහ ජංගම වායුසමන තාක්ෂණ ශිල්පීන්ගේ කාර්ය මට්ටම උසස් කිරීම, ආරක්ෂාව සහතික කිරීම සහ එම ක්ෂේත්‍රය තුළ වැඩි වෘත්තීයමය මට්ටමක් ප්‍රවර්ධනය කිරීම සඳහාය.

EOG 07 - 0011/1

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 39 වන වගන්තිය යටතේ ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් සාදන ලද රීති.

ඉංජි. (ආචාර්ය) **තිලක් ද සිල්වා,**
සභාපති.

2026 ජුනි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව,
කොළඹ දී ය.

රීතිය

රීති අංක: 2/2026

01. මෙම රීතිය සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මිකයකු ලෙස ලියාපදිංචි කිරීමේ රීතිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම.

02. 2028 ජනවාරි 01 දින සිට 2029 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස එයට අදාළ කටයුතුවල නියැලීමට ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 3 වන මට්ටම (NVQ Level 3) අවම සුදුසුකම ලෙස තිබීම අනිවාර්ය වේ.

03. 2030 ජනවාරි 01 දිනෙන් පසුව, සූර්ය බලශක්ති කාර්මික ශිල්පියෙකු ලෙස ඊට අදාල කටයුතුවල නියැලීමට අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

- ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 4 මට්ටම. (NVQ Level 4)
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචිවීම.

04. අදාළ ජාතික වෘත්තීය නිපුණතා විෂය ක්ෂේත්‍ර ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ නිල වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

05. මෙම නියාමන පියවර ක්‍රියාත්මක කරනුයේ ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පීන්ගේ කාර්ය මට්ටම උසස් කිරීම, ආරක්ෂාව සහතික කිරීම සහ එම ක්ෂේත්‍රය තුළ වැඩි වෘත්තීයමය මට්ටමක් ප්‍රවර්ධනය කිරීම සඳහාය.

EOG 07 - 0011/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.